**වීරකැටිය ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේදී සභාව සතු දේපල 10 ක් සංවර්ධනය කිරීම සඳහා දරන ලද රු. 4,888,601 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | දේපල සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂයේ කඩ 05 ක් බදු දීමෙන් ලැබිය යුතු රු. 1,469,000 ක් වූ එක්වන් මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු එක්වන් මුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුවේ. | ගිවිසුම් ප්‍රකාරව එක්වන් මුදල් නියමිත කාලය තුළ ගෙවා නොතිබීම නිසා 2019 වර්ෂයේදී දී බදු අයිතිය අහෝසි කිරීමේ ක්‍රියාමාර්ග වෙත පිවිසි බවත්, සභාව වෙත තවදුරටත් ලැබිය යුතු මුදලක් ලෙස නොසලකා ගිණුම් තුල ඇතුළත් කර නොමැති බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම් රු. 2,755,045 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මුද්දර ගාස්තු ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | සභාව වෙත ලැබුණු උපලේඛන අනුව එකතුව රු. 13,775,224 ක් ගිණුම්ගත කර ඇති බව දන්වමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 04 කට අදාළ රු. 457,726,723 ක් වූ එකතු ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුවෙහි රු. 51,580,694 ක අසමානතාවයක් පැවතුණි. | ගිණුමේ දැක්වෙන ශේෂ වලට අදාල උපයෝගී ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | උපලේඛන සකස් කිරීමේදී සිදුව ඇති දෝෂ හේතුවෙන් වෙනස සිදුව ඇති බවත්, ඉදිරියේදී ඒවා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතුව රු. 145,626,591 ක් වූ ගිණුම් විෂයයන් 16 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ නිවැරදිව සකස් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 134 (2) | සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශ වාර්ෂිකව හඳුනා ගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතු ආරම්භ කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය<br>-------------------------------- | | | |
| | රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>-------------------------------- | | | |
| i. | මු. රෙ. 134 (3) | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. |
| ii. | මු. රෙ. 371(5) | ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂයේදී ලබාගත් රු. 135,555 ක අත්තිකාරම් වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මැතිවරණ රාජකාරි සඳහා ලබා ගත් රු. 125,555 ක් පියවා ඇති බවත්, ඉතිරි රු. 10,000 පියවීම සඳහා කටයුතු කරන බව දන්වා සිටිමි. |
| iii. | මු. රෙ. 571 | කල් ඉකුත් වූ රු. 324,215 ක තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. |
| iv. | මු. රෙ. 702 (3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. |
| v. | මු. රෙ. 1645 (ආ),(ඇ) සහ 1646 | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු වාහන 17 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| i. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 19 ක ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| ii. | 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/REG/2015/08 පොදු(i) දරණ ලිපියේ 4.3 (අ) , (ඉ) ඡේද | 2005 වර්ෂයට අදාළ රු. 9,264 ක සේවක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය නියමිත පරිදි අය කළ යුතුවේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| (ඉ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො / 2010 / 01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | සභාව සතු කඩ කාමර 26 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නියමිත කාලයේදී ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 27,595,351 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,601,699 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,854,000 | 2,993,291 | 3,035,100 | 4,924,579 | 1,740,000 | 1,909,941 | 1,364,750 | 4,966,389 |
| කුලී | 23,856,000 | 25,602,292 | 23,225,245 | 5,583,533 | 17,356,000 | 17,165,685 | 10,500,898 | 3,206,486 |
| බලපත්‍ර ගාස්තු | 2,163,000 | 1,886,919 | 1,951,199 | 62,087 | 1,787,000 | 1,724,170 | 1,688,086 | 126,367 |
| වෙනත් ආදායම් | 11,891,000 | 20,133,194 | 15,317,785 | 62,527,505 | 10,153,000 | 13,261,847 | 5,742,832 | 32,969,481 |
| එකතුව | 40,764,000 | 50,615,696 | 43,529,329 | 73,097,704 | 56,537,200 | 34,061,643 | 19,296,566 | 41,268,723 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට වරිපනම් බදු රු. 4,741,405 ක් අයවීමට තිබූ අතර පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව එම හිඟයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ වරිපනම් බදු ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් 2002 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයටද බදු අයකර තිබුණි. | වසර 05 කට වරක් තක්සේරු සංශෝධනය කළ යුතුවේ. | 2018 වර්ෂයේදී සිදුකළ දේපල තක්සේරුව මත පදනම්ව 2021 වර්ෂයේ සිට වරිපනම් බදු අය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු රු. 155,250 ක් වූ ව්‍යාපාර බදු සහ රු. 27,925 ක අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ව්‍යාපාර බදු හා අක්කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපාර බදු හා අක්කර බදු වලින් පිළිවෙලින් රු. 6,000 ක් හා රු. 504 ක් අයකර ගත් බවත්, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත හා බිල් කළ කුලී ආදායම පිළිවෙලින් රු. 23,856,000 ක් හා රු. 25,602,292 ක් වූයෙන් තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කළ යුතුවේ. | නව තක්සේරුව ක්‍රියාත්මක වීම හා නව කුලී ආදායම් මාර්ග හඳුනා ගැනීම නිසා බිල් කළ වටිනාකම ඉහළ ගොස් ඇති බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාව සතු කඩ කාමර 15 කින් හා පොළ බදු දීම වෙනුවෙන් ලැබිය යුතු පිළිවෙලින් රු. 112,370 ක් හා රු. 5,432,413 ක් අයකර නොතිබුණි. | හිඟ කුලී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩ කාමර 05 කින් රු. 35,800 ක් අයකරගත් බවත්, ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකර ගන්නා බවත්, හිඟ පොළ බදු අයකර ගැනීම සඳහා අධිකරණයේ නඩු පවරා ඇති බව දන්වමි. |

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 1,499,903 ක් හා රු. 61,027,602 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අදාල බලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු සියළු මුදල් ගෙන්වා ගැනීම සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් කර ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට කරුණු 29 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අවශ්‍යතාවය මත අතුරු ව්‍යස්ථා පනවා ගැනීමට කටයුතු කරමි. |

**(ආ) අපේක්ෂිත නිමයුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අයවැය මඟින් සංවර්ධන යෝජනා 71 ක් සඳහා රු. 7,100,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර එයින් රු. 300,000 ක් වටිනා යෝජනා 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. තවද අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබූ රු. 900,000 ක් වටිනා ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කර තිබුණි. | අයවැය ලේඛනයෙහි ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | සුවිශේෂී කරුණු මත ඇතිවන අවශ්‍යතාවයන් සලකා අයවැය සංශෝධනයන් සිදු කරමින් සභා අනුමැතිය යටතේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කර ඇති බව දන්වමි. |

**(ඈ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක වලට යොමු වූ යෝජනා රැසක් සභාව විසින් කරන ලද ව්‍යාපෘති තුළින් ඉටු වී ඇති බවත්, ඍජුවම දර්ශකවලට ඉලක්ක වූ යෝජනා සකස් කර ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී විද්‍යුත් පුස්තකාලය වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු. 766,750 ක් වටිනා පරිගණක උපකරණ භාවිතයට නොගැනීම නිසා එහි වගකීම් කාලය ඉක්මවා ගොස් තිබුණි. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | පුස්තකාල සාමාජිකයින් හට පරිශීලනයට අවස්ථාව ලබා දීම සඳහා අවශ්‍ය උපරිම කටයුතු කර ඇති බවත්, තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර ඉදිරියේදී භාවිතයට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාව සතු ආදාහනාගාරය අක්‍රීයව පැවතුණි. | පොදු සුහසාධන පහසුකම් නොපමාව ඉටුකිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී භාවිතයට ගැනීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### 3.3.1 සේවක පුරප්පාඩු හා අතිරික්තතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 13 ක් පිරවීමට හා අතිරික්තතා 14 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු 05 ක් ප්‍රධාන අමාත්‍යාංශයෙන් සම්පූර්ණ කළ යුතු බවත්, ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ සේවය කරන නිලධාරීන් 04 දෙනෙකු නියමිත තනතුරට පරිබාහිර වෙනත් රාජකාරිවල යොදවා තිබුණි. | නිලධාරීන් අනුමත රාජකාරි වල යෙදවිය යුතුවේ. | පුරප්පාඩු පවතින තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් සිදු කළ පසු අදාල සේවකයන් ඔවුන්ට හිමි නිත්‍ය තනතුරු වලට අනුයුක්ත කරන බව දන්වමි. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් හා මානව සම්පත් සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල ගිවිසුම් හා සැලසුම් පිළියෙල කිරිමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

### 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වාහන නඩත්තුව හා අළුත්වැඩියාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ වාහන 04 ක් සඳහා සමාලෝචිත වර්ෂයට ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | වාහන 03 කට අදාළව ලියාපදිංචි සහතික නොමැති බැවින් ආදායම් බලපත්‍රය ලබා ගත නොහැකි වී ඇති බවත්, අත්ට්‍රැක්ටරය නඩු භාණ්ඩයක් ලෙස පවතින අතර එය ධාවන තත්ත්වයේ නොපවතින බව දන්වමි. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ක්‍රීඩා පිටි 04 ක, ප්‍රජා ශාලා 07 ක, සුසාන භූමි 69 ක හා වාහන 06 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | වාහන 06 න් ට්‍රැක්ටර් 02 කට අදාළව ලිඛිත තොරතුරු නොමැති වීම නිසා පවරා ගැනීම් සිදු කළ නොහැකි වී ඇති බවත්, ඉතිරි වාහන පවරා ගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතින බවත්, සුසාන භූමි, ප්‍රජා ශාලා, ක්‍රීඩා පිටි මැනුම් කිරීම සඳහා ප්‍රතිපාදන නොමැති වීම නිසා පවරා ගැනීම් ප්‍රමාද වී ඇති බව දන්වමි. |

**3.4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වලස්මුල්ල වෙළඳපොල ඉදිරිපිට කඩ කාමර 02 න් ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු කඩ කාමර කුලියට හෝ බද්දට දීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ටෙන්ඩර් මඟින් මෙම කඩ කාමර ලබා දීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව විසින් 2017 වර්ෂයේ මිලදී ගත් කළමනාකරණ තොරතුරු පද්ධති තුන අතුරින් වටිනාකම රු. 90,000 ක් වූ ලේඛණාගාර තොරතුරු පද්ධතිය අක්‍රියව පැවති අතර මෙම පද්ධතීන් ආයතනයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සංවර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් සංවර්ධනය කිරීමට හා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය සංවර්ධනය කිරීම් සිදු කර දෙන ලෙස සැපයුම්කාර ආයතනය වෙත දැනුම් දී ඇති බව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.5.2 සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් එකතුව රු.495,540 ක් වූ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් නොවූ මිලදී ගැනීම් විය. | වර්ෂය තුළ අවශ්‍යතාවයන් හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | කාලීනව ඇති වූ අවශ්‍යතාවයන් සලකා බලා නිසි අනුමැතියක් යටතේ මිලදී ගැනීම් සිදු කළ බව දන්වමි. |
| (ආ) | රු.136,100 ක් වටිනා මිලදී ගැනීම් සම්බන්ධයෙන් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 ඡේදයට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම නිසා රු. 43,500 ක අමතර වියදමක් දරා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |